# සාමය හා ගැටුම් නිරාකරණය පිළිබඳ බෞද්ධ ප්‍රවේශය
## (තෝරාගත් මූලධර්ම කිහිපයක් ඇසුරින්)

කිරිමැටියාවේ ධම්මසිරි හිමි

### හැඳින්වීම

මෙම පර්යේෂණය තුළින් සිදු කිරීමට අපේක්ෂා කරනුයේ තෝරාගත් මූලධර්ම කිහිපයක් ඇසුරින් සාමය හා ගැටුම් නිරාකරණය පිළිබඳ බුදු සමය දක්වා ඇති ස්ථාවරය විමර්ශනය කිරීමය. මෙහිදී යුධ ගැටුම් නිරාකරණය සඳහා යොදාගනු ලබන මූලධර්ම මූලික වශයෙන් බටහිර සංකල්ප හා බෞද්ධ සංකල්ප යන පරාසයන් තුළ සාකච්ඡා කිරීමට පර්යේෂකයා උත්සහ කරනු ලබයි. බුදුසමය වනාහි ක්‍රි.පූ හයවන සියවසයේ ඉන්දියානු හින්දු ආගමික පරිසයේ පහලවූ ආධ්‍යාත්මිකවූ ද, දාර්ශනිකවූ ද, ආගමිකවූ ද ඉගැන්වීමකි. සමස්ත ඉන්දීය ආගමික, සාමාජීක හා දේශපාලනික තන්ත්‍ර සියල්ලම නිර්මාණවාදය නිමැති මූලික සංකල්පයක් මත ක්‍රියාත්මක වූ අවස්ථාවක ඊට ප්‍රතිචාර ලෙස බුදු සමය නැමති ආගමික සංස්ථාව ස්ථාපනය විය. මූලික වශයෙන් බුදු සමයේ කාර්යභාරය බවට පත්ව ඇත්තේ දුකින් පෙළෙන මිනිසා එකී දුක්ඛදායක තත්වයෙන් මුදවා ඔහුට සදාතනික සැපයක් හිමිකර දීමය.

බුදු සමයේ දැක්වෙන ඉගැන්වීම් සියුම්ව පරීක්ෂා කළවිට පෙනීයන්නේ එම ඉගැන්වීම් එක් ආකාරයට මානවයාගේ ව්‍යවහාරික ජීවිතය පෝෂණය කරන අතරම අනෙක් අතට මානවයාගේ ලෝකෝත්තර ජීවිතය ද පෝෂණය කරන බවයි. නූතන ලෝකයේ මානවයා හමුවේ ඇති ප්‍රබලතම බාධකය වී ඇත්තේ මිනිසා මිනිසාටම එරෙහි වෙමින් ආගමික වූ, දේශපාලනික වූ, සංස්කෘතික වූ කරුණු මුල් කරගනිමින් යුධමය තත්වයකට අනුගතව ක්‍රියා කිරීමයි. මෙම තත්වය විසඳීමෙහිලා ලෝකයේ විවිධ සංවිධාන හා රාජ්‍යයන් ක්‍රියාත්මක වේ. එහෙත් කිසිදු සංස්ථාවක් හෝ රාජ්‍යයක් මිනිස් මනසේ ක්‍රියාත්මක වන යුධමය මානසිකත්වය බැහැර කරවීමට සමත්වී නැත. ඒ අනුව මෙම පර්යේෂණ තුළින් සිදු කිරීමට අපේක්ෂා කරනුයේ නූතන ලෝකයේ ගැටුම් විසඳීම සඳහා යොදාගනු ලබන මූලධර්ම කිහිපයක් බෞද්ධ ඉගැන්වීම් හා තුලනය කරමින් කරුණු විභාග කිරීමය.

විශේෂයෙන්ම බෞද්ධ විමර්ශනයට අනුව මානවයාගේ පැවැත්ම යනු සංසාරිකව නොවිසඳුන ගැටලුවක ප්‍රතිපලයකි. බුදු සමයට අනුව ගැටුම යනු කුමක්දැ යි පරීක්ෂා කරන්නේ නම් එම පදය මූලික වශයෙන් සංස්කෘත භාෂාව ඇසුරින් 'සර්ෂණ' ලෙසත් පාලි භාෂවෙන් 'සංඝට්ටන' වශයෙනුත් ව්‍යවහාරයට පත්ව ඇති අතරම එහි සිංහල රූපය 'ගැටුම' යනුවෙන් ව්‍යවහාරයට පත්ව ඇත. මෙම වචනය සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් සමාන පද රාශික් දක්වා ඇත. ඒ අතර Conflict, clash, combat, contend, contest, disagree, fight, interfere, strive, struggle, මෙම සියලු වචන තුලින් ගැටුම යන අදහස ඉදිරිපත් වේ.

ලෝකයේ මෙතෙක් පහලවී ඇති සියලු ආගම් දෙස අවධානය යොමුකළ විට පෙනීයන එක් කරුණක් නම්, ලෝක ආගම් අතරින් සාමයට මිනිසා මෙහෙයවූ ප්‍රභලතම ආගම ලෙස බුදු සමය සැලකිය හැකි බවයි. ගැටුමකට මූලික වශයෙන් පාදක වන ලෝභ, ද්වේශ, මෝහ යනුවෙන් චිත්තවේග තුනක් පිළිබඳ බුදු සමය කරුණු දක්වනු ලබයි. බුදු සමයේ ඉගැන්වෙන විමුක්තිය උදාකර ගත හැක්කේ මිනිස් මනසේ ක්‍රියාත්මක වන මෙම ඍණාත්මක චිත්තවේග දුරුකරමින් ධනාත්මක චිත්තවේග වර්ධනය කිරීම තුලින්ය. විශේෂයෙන්ම අප විසින් අවබෝධ කරගත යුතු මූලික දෙයක් නම් ගැටුම නැමති මානසිකත්වය ගොඩනැගීමට මුලින් දැක්වූ ඍණාත්මක චිත්තවේග ප්‍රබල දායකත්වයක් සලසන බවයි. අනෙක් අතට ගැටුම නැමති මානසිකත්වය මූලික වශයෙන් නිර්මාණය වනුයේ රෝග කාරක මනසක ඇති රෝගී ලක්ෂණ බාහිර ලෝකයට මුදාහැරීමක් ලෙසිණි. ඒ අනුව නූතන ලෝකයේ පවතින ගැටුම් අතර යුද්ධය යන ගැටුම පිළිබඳව අප අවධානය යොමුකළ හොත් ඊට ප්‍රතිවිරුද්ධ ක්‍රියාකාරිත්වය සාමය විය යුතුය. සාමය සැබවින්ම නිර්මාණය විය යුත්තේ බාහිර ලෝකයේ නොව පුද්ගලයාගේ මනසේය. මනස ගැටුම්කාරි වූ විට බාහිර ක්‍රියාකාරකම් ද ගැටුම්කාරි වේ. සාමකාමී මානසිකත්වය සාමකාමී පුද්ගලයෙක් නිර්මාණය කිරීමට ද, සාමකාමී පුද්ගල ඒකරාශියක් මගින් සාමකාමී සමාජ සංස්ථාවක් බිහි කිරීමට ද, සාමකාමී සමාජ සංස්ථාවක් බිහිවීම මගින් සාමකාමී රටක් නිර්මාණය කිරිමය සමත් වේ. මේ අනුව ගැටුම් නිරාකරණය වෙනුවෙන් බුදු සමයේ දැක්වෙන මූලික ඉගැන්වීම් විවිධ බෞද්ධ දේශනා ඇසුරින් තහවුරු කළ හැකිය. විශේෂයෙන්ම පංචශිල ප්‍රතිපදාවට අනුගතව එම



ප්‍රතිපදාව ප්‍රායෝගිකව සෑම පුද්ගලයෙක්ම ක්‍රියාත්මක කරන්නේ නම් සමස්ථ සමාජයම සුවපත් සමාජයක් වනු ඇත. ඒ අනුව පඤ්ච සීලය ආරක්ෂා කිරීම සාමයට ඇති මාර්ගය ලෙස ද එය කඩකිරීම ගැටුමකට ඇති ප්‍රවේශය ලෙස ද සැලකිය හැකිය. එක් අවස්ථාවක බුදුන් වහන්සේගෙන් ගැටලු පිළිබඳව දෙවියෙක් අසන ලද පැනයට දෙන පිළිතුර වනුයේ ගැටලු විසඳීමට ඇති කදිම මඟ සීලයෙහි පිහිටා ක්‍රියාකාරීම බවයි. ඒ අනුව සීලයෙහි යම්තාක් සමාජ සත්වයා නොපිහිටන්නේද එතෙක් සමාජයේ ගැටුම් පවතින බව බුදු සමය පිළිගනු ලබයි.

සාමය සමාජයෙන් ක්‍රමයෙන් තුරන්වීම කෙරෙහි හා ගැටුම් නිර්මාණය වීම කෙරෙහි බලපා ඇති විවිධ කරුණු මූලික වශයෙන්, නූගත්කම, විරැකියාව, සමාජ අසහනය, වාර්ගවාදය, වර්ණවාදය, ආගම්වාදය, සංස්කෘතික විචල්‍යතාවන්, සම්පත් ඌනතාවය, දේශපාන අස්ථාවරත්වය, රාජ්‍ය ආක්‍රමණ, යන අංශයන් ලෙස සැලකිය හැකිය. නූතනයේ පවතින ගැටුම් නිර්මාණය වීමේදී උක්ත අංශයන් ප්‍රධාන ස්ථානයෙහිලා සැලකිය හැක. මෙකී සියලු සමාජ අස්ථාවරත්වයන් නිර්මාණය වනුයේ පුද්ගලයාගේ මනසේ නිරන්තරයෙන් ක්‍රියාත්මක වන ලෝභ සහගත වූත්, මෝහ සහගත වූත්, ද්වේශ සහගත වූත් මනෝභාවයන් බව අප අවබෝධ කරගත යුතුය. ඒ අනුව එකී මනෝභාවයන් වෙනුවට මෙත්තා කරුණා මුදිතා උපෙක්ෂා වැනි උතුම් ආධ්‍යාත්මික ගුණ ධර්ම ගොඩනගා ගත යුතුය. මෙම ගුණ ධර්ම පුද්ගල මනසේ පෝෂණය කිරීම තුලින් සමාජ කණ්ඩායම් අතර හා ජන කණ්ඩායම් අතර නිර්මාණය විය හැකි ගැටුම් සමනය කරගත හැකිය. තවත් ආකාරයකට බුදු සමයේ ඉගැන්වෙන් සීල, සමාධි, පඤ්ඤා යන අවස්ථා පරිපූර්ණත්වයට පත්කිරීමේ අවසන් ප්‍රතිපලය වනුයේ ද ප්‍රායෝගික ලෝකයේ සාමය ක්‍රියාත්මක කිරිමක් වශයෙනි.

ලෝකයට සාමය නැමති සංකල්පයක මූලික අවශ්‍යතාව ගොඩනැගුනේ දෙවන ලෝකයුද්ධයෙන් පසුව යැයි කිව හැකිය. ඊට හේතුව 1945 දී හිරෝෂිමා හා නාගසාකි යන ජපන් නගර පරමානු බෝම්බ වලින් විනාශ වීමත් එම විනාශයේදී මිනිසා මුහුණ දුන් භයානක තත්වය නිසාය. අවසානාවකට සාමය පිළිබඳව විවිධ සංවාද සාකච්චා පැවතිය ද මේ මොහොත වන තෙක්ම මිහිතලය මත තිරසාර සාමයක් උදාවී නැත. යම් හේකින් තුන්වන ලෝකයුද්ධයක් නිර්මාණය වුවහොත් මේ ලෝකයේ ජයග්‍රහණය සැමරිමට පවා

කිසිවෙකු ඉතිරි නොවනු ඇත. ඒ අනුව පෙනීයන්නේ ගැටුම් ප්‍රබල ලෙස ලෝකයේ ව්‍යාප්තවී ඇති ආකාරයයි. තවත් අතකට ලෝකයේ ජීවත්වන ප්‍රබලතම සතුරා බවට මිනිසා මෙම ගැටුම් හමුවේ පත්වී ඇත. අසල් වැසියාට ප්‍රේම කරන්න, සියලු සත්වයන්ට මෛත්‍රිය කරන්න, යන බුදු සමයේ හා කිතුසමයේ එන ඉගැන්වීම් මිනිසාගේ මනසින් දුරස්වී, යුද්ධයේ ප්‍රතිඵල ලෙස අසල්වැසියා කෙරෙහි සැකයෙන් බලන්න, සියලු සත්වයාට ද්වේශ කරන්න යන මනෝභාවයක් මෙකී ගැටුම් හරහා සමාජයේ නිර්මාණය වී ඇත. මේ සඳහා කවරෙකු වගකිව යුතුද? මිනිසා මිනිසාට එරෙහි වූයේ මන්ද? මිනිසා තරම් කෲර සත්වයෙන් මිහිපිට නොමැති කරමට මිනිසා විසින් මිනිස් සිත ලෝකයේ හසුරුවනු ලබයි. ඒ අනුව පෙරට වඩා සාමයක අවශ්‍යතාව ලෝකයේ මූලික අවශ්‍යතාවයක් බවට පත්වී ඇත.

## ගැටුම් විසඳීම සඳහා බෞද්ධ ප්‍රවේශය

බුදු සමයට අනුව මිනිසාගේ පැවැත්ම ක්‍රියාත්ම වනුයේ තෘෂ්ණාව මතය. යුධ ගැටුම් පවතින්නේ අප මනසේ පවතින තෘෂ්ණවට සාපේක්ෂකවය, නිදසුන් ලෙස එක් ජන කොටසක් යුද්ධ කරනුයේ ගංගාවක ජලය බෙදාගැනීමට වන අතර තවත් ජන කොටසක් යුද්ධ කරනුයේ දේශ සීමා වෙනුවෙන් විය හැකිය. මීට අමතරව තවත් ජන කොටසක් යුද්ධ කරනුයේ ස්වකීය ආගමික අවශ්‍යතා වෙනුවෙන් විය හැකිය. කෙසේ වුවත් අවසානයේ පෙනීයන්නේ සාංසාරික සත්වයාගේ නිමක් නොවන තෘෂ්ණාවේ ප්‍රතිපල ගැටුම් ලෙස විවිධ ස්වරූපයෙන් ලෝකයේ පවතින බවයි. මේ අනුව ලෝකයේ පවතින විවිධ ගැටුම් නිරාකරණය කරගැනීම සඳහා පළමුව අප විසින් කළයුතු වන්නේ ගැටුමකට හේතුවන මූලික අභ්‍යන්තරික හේතු වලට විසඳුම් සෙවීමය. අභ්‍යන්තරික ගැටලු පිළිබඳව අවධානය යොමු නොකර බාහිර දේ සඳහා පමණක් ප්‍රතිකර්ම කිරීම ප්‍රායෝගිකව ගැටුම් නිරාකරණය කිරීමේ වෑයම අර්ථ ශුන්‍ය ක්‍රියා විය හැකිය. ඒ අනුව බුදු සමය සෑම විටම ගැටලුවක බාහිර ස්වරූපයට ප්‍රතිකර්ම එක එල්ලේ යෝජනා නොකරන අතර ගැටලුවේ සමස්ථය විමසා එහි අභ්‍යන්තරයට විසඳුම් යෝජනා කරනු ලබයි. මේ සඳහා මූලික නිදර්ශනය බුදුන් වහන්සේගේ පළමු ධර්ම දේශනයෙන් ම තහවුරු කරගත හැකිය.



බුදු සමයේ ඉගැන්වෙන මූලික ඉගැන්වීමක් ලෙස චතුරාර්ය සත්‍ය හඳුන්වා දිය හැකිය. චතුරාර්ය සත්‍යයේ ප්‍රධානතම ඉගැන්වීම වනාහි ලෝකයේ යථා ස්වභාවය මිනිසාට අවබෝධ කරදෙමින් සංකල්පිය ලෝකයෙන් වියුක්තව මමය, මාගේය, මා සතුය, යනාදීවූ මමායනය පිළිබඳ හැඟීම් වලින් තොරව ක්‍රියාකිරීමට මිනිසා ස්වකීය ක්‍රියාකාරිත්වය හසුරුවා ගත යුතු ය යන ඉගැන්වීම පෙන්වා දීමය. සිව් සත්‍යයේ දැක්වෙන විමර්ශනයට අනුව දුක්ඛ ආර්ය සත්‍ය හා දුක්ඛ සමුදය ආර්ය සත්ත්‍ය යන අවස්ථාවන් තුල පෙන්වා දෙනුයේ, පළමුවෙන් දුක යනු කුමක්? යන පැනයට පිළිතුරු සැපයීමයි. එය උපත මුල්කර ගනිමින් සිදුවන බව පෙන්වාදී ඇත. දුක්ඛ සමුදය ආර්ය සත්‍යයට අනුව දක්වා ඇත්තේ දුක්ඛයන්ගේ හටගැනීමට පාදක වන කරුණු පිළිබඳවය. එහිදී තෘෂ්ණාව ආසන්නතම කාරණය ලෙස දක්වා ඇත. ලෝකයේ මෙතෙක් පැවති සියලු යුධ ගැටුම් පිළිබඳව සියුම්ව අවධානය යොමු කළ විට පෙනීයන එක් කරුණක් නම්, සියලු යුද්ධ පුද්ගලයාතුල පැවති තෘෂ්ණාවේ ප්‍රතිපල මත ක්‍රියාත්මක වූ බවයි. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය හා දුක්ඛ නිරෝධගාමිනි පටිපදා ආර්ය සත්‍යයන්ට අනුව විශේෂයෙන්ම දුක නැවැත්වීම හා දුක් නැවැත්වීමේ මාර්ගය වශයෙන් විභාග කර ඇත. ඒ අනුව ලෝකයේ පවතින කිසියම් ගැටලුවක් වේ නම්, එකී ගැටලුව විසඳීමට ආකල්පයක්, කැමැත්තක්, අවශ්‍යතාවක්, උවමනාවක් ඒ ඒ පාර්ශවයන් තුලින් යෝජනා විය යුතුය, පසුව පලදායි මාර්ගයට අනුව ගැටලුව විසඳිය යුතුය. බුදු සමයේ ඉගැන්වෙන චතුරාර්ය සත්‍ය විග්‍රහය දෙස පරීක්ෂාකාරීව බලන විට පැහැදිලි වනුයේ, යමෙකුට දුක නැමති ගැටලුව විසදා ගැනීමට නම් එය ගැටලුවක් බව තමා විසින් අවබෝධ කරගත යුතු බවත්, පසුව එය විසඳාගැනීම සඳහා පුද්ගලයාතුල විසඳාගැනීමේ මානසික තිබිය යුතු බවත්ය. මෙම විග්‍රහයම වෙනත් ගැටලුවක් නිරාකරණය සඳහා යොදාගන්නේ නම් පළමුවෙන්ම කළ යුතු කාර්ය වනුයේ පවතින තත්වය හමුවේ (එය) ගැටලුවක් බව තේරුම් ගැනීමය. පසුව එය විසඳීමේ අවශතාවක් කුමන හෝ පාර්ශවයකට තිබිය යුතු. අනතුරුව එය විසඳීම සඳහා යාන්ත්‍රණයක් සකසා පසුව ක්‍රියාත්මක කළ යුතුය. ඒ අනුව චතුරාර්ය සත්‍ය පිළිබඳ ඉගැන්වීම ද හුදෙක් දුක පිළිබඳව, දුකම පමණක් විග්‍රහ කරන්නට සීමා නොවූ ඉගැන්වීමකි. එය ලෝකයේ පවතින බෝහෝ ගැටලු විසඳා ගැනීම සඳහා විසඳුම් සොයාගැනීමේ උපාය මාර්යක් ලෙස ද භාවිතා කළ හැකිය. නිදසුනක් ලෙස ගැටුමක්



02 OCT 2015

පිළිබඳව කරුණු පරීක්ෂා කළහොත් මෙසේ දැක්විය හැකිය. (අ. ගැටුම ආ. ගැටුමට හේතුව ඇ. ගැටුම විසදීම ඈ. ගැටුම විසඳුම් මාර්ගය. මෙම මාර්ගයම විරැකියාව පිළිබඳව යොදාගතහොත් (අ. වැරුකියාව ආ. විරුකියාවට හේතව ඇ. විරුකියාව විසදීම ඈ. විරැකියා විසඳුම් මග. අනෙක් අතට අප විසින් කල්පනා කළ යුතු කරුණ නම් ලෝකයේ පවතින යම් ගැටලුවක් විසඳීමේදී අදාළ ගැටලුවට භාජනය වන සියලු පාර්ශවයන් ලෝභ, ද්වේශ, මෝහ වශයෙන් හෝ අගතිමය තත්වයකින් ක්‍රියා නොකළ යුතු බවයි. යමෙක් හෝ යම් පාර්ශවයක් අගතිමය තත්වයෙන් ක්‍රියාත්මක වන්නේනම් කිසිදු ගැටලුවක් විසඳීමට අවස්ථාවක් උදා නොවනු ඇත. ඒ අනුව පෙනීයන්නේ ගැටලු විසඳාගැනීමේදී මූලික වශයෙන් අවශ්‍ය වනුයේ නිරෝගිමත් පුද්ගල මනසක්ය. නිරෝගිමත් පුද්ගල මනසක් නිර්මාණය වනතාක්ම ගැටලුවක් විසඳිය නොහැකිය. ඒ අනුව මිනිස් මනසේ ක්‍රියාත්මක වන තෘෂ්ණාව යම් දිනෙක මුලිනුපුටා දමන්නේනම් එදින ස්වකීය මනස් අභ්‍යන්තරයේ සාමයේ බීජ රෝපනය වනු ඇත.

අනෙක් අතට බුදු සමයේ ඉගැන්වෙන ආර්ය අෂ්ඨාංගික මාර්ගය පිළිබඳව අවධානය යොමු කිරීමේදී, පුද්ගලයා අන්තගාමී ක්‍රියා කාරිත්වයෙන් වියුක්ත විය යුතු බවයි. අන්තගාමිත්වය නිවන් මාර්ගයට ද මූලික වශයෙන් බාදකයක් වන අතරම ලෝකයේ පවතින සියලු ගැටුම් නිර්මාණය වනුයේ අන්තගාමී මතවාද හෝ ක්‍රියා කාරකම් අනුව කටයුතු කිරිම මතය. මේ අනුව බුදු සමයේ ඉගැන්වෙන ආර්ය ආෂ්ටාංගික මාර්ගය හුදෙක් මිනිසාගේ විමුක්තිමය ජීවිතය පෝෂණය කිරීමට පමණක්ම ආවෙණික වූවක් නොව, ඒ තුළින් ව්‍යවහාරික ජීවිතය සකසා ගැනීම සඳහා මෙන්ම මානව ජීවිතය හා බද්ධවූ විවිධ ගැටලු නිරාකරණය කිරීම සඳහා යෝජිත උපාය මාර්ගයක් ලෙස ද සැලකිය හැකිය.

සංයුත්ත නිකායේ නිදාන සංයුත්තයට අනුව ගැටුම් පහලවීම පිළිබඳ මනෝමූලික විමර්ශනයක් බුදු සමය සපයා ඇත. එහි දක්වා ඇති ආකාරයට සමාජ ගැටලුවල නිර්මාණය තෘෂ්ණාව මුල්කොට පවතින බව ඉදිරිපත් කරනුයේ තණ්හාව නිසා පරියෙසනය එනම් කැමති දේවල් සෙවීමත් සෙවීම නිසා ලැබීමත් (ලාභ) ලැබීම නිසා ඒ ලැබූ දේවල් සම්බන්ධයෙන් යම් යම් තීරණ ගැනීමත් (විනිච්ඡය) මෙම තීරණ අනුව ඒවා පිළිබඳ දැඩි ඇල්මත් (ඡන්දරාග) දැඩි ඇලීම පදනම් කොට ගෙන ඒවා සම්බන්ධයෙන් මුසපත් වීමත් (අජ්ජෝසානා) මුසපත් වීමනිසා ඒවා දැඩිව ග්‍රහණය කරගැනීමත් (පරිග්ගහ) දැඩි ග්‍රහනය නිසා ඒවා තමන්ට මිස අන් අයට නොවේවා යන මසුරු බවත් (මච්ඡරිය) මසුරුබව නිසා ඒවා ආරක්ෂා කිරීමත් (ආරක්ඛ) ආරක්ෂා කිරීමට යෑම නිසා දඬුමුගුරු ගැනීමත් (දණ්ඩදාන) ආයුධ ගැනීමත් (සත්ථදාන) කල කොලාහල (කලහා) යුද්ධ (විග්ගහ) වාදවිවාද (විවාද) තෝ තෝ යනුවෙන් බැන දොඩා ගැනීම (තුවං තුවං) කේළම් කීම (පෙසුඤ්ඤ-ප්‍රියත්වයෙන් තොර වචන කීම) බොරු කීම (මුසා) වැනි පව්ටු ධර්ම හටගනී. මෙලෙස සමාජය තුළ නිර්මාණය වනු ලබන සියලු ගැටුම් පුද්ගල මානසිකත්වය තුල ඇති වන අසහනකාරි බවේ සංකේතයන් ලෙස සැලකිය හැකිය.

තවත් ආකාරයට මෙම මානසික ගැටුම්කාරි තත්වයම සමාජය පරිහානිය දක්වා ව්‍යාප්තවූ ආකාරය දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේදී සාකච්ඡා කොට තිබේ. එම සූත්‍රයේ දක්වා ඇති ආකාරයට ආදිතම සත්වයාන් අතර කිසිදු විභේදයක් නොපැවති අතර මානසිකමය වශයෙන්ද, අහාරමය වශයෙන්ද, පාරිසරිකමය වශයෙන්ද සිදුවූ වෙනස් කම්වල ප්‍රතිඵල වශයෙන් මිනිසා සදාචාරාත්මක වශයෙන් පරිහානියට පත්විය. මෙම පරිහානිය මූලික වශයෙන් ආරම්භ වූයේ පම්පත් මුල්කරමින් බව සූත්‍රයේ පැහැදිලිවම දක්වා ඇත. විශේෂයෙන්ම සම්පත් යුගවශයෙන් අදියර හතරක් ඔස්සේ ඉදිරිපත් කර ඇත. 1. රසපඨවි යුගය 2. භූමිපප්පටක යුගය 3. බදාලතා යුගය 4. සාලි යුගය. මෙම යුගයන් හා එම යුගයන් තුල පැවති සම්පත්වල ස්වරූපය දෙස අවධානය යොමුකළ විට පැහැදිලිවම පෙනීයන්නේ මුල් යුගයේ (එනම් රසපඨවි යුගයේ) පැවති සම්පත් වලට වඩා පසුව නිර්මාණය වූ සම්පත් තත්වයෙන් ඉහල ස්වරූපයක් ගන්නා බවයි. ඊට හේතුව සම්පත් බෙදාගැනීම ආරම්භවූයේ සාලි යුගයේදී මෙන්ම සම්පත් සොරාගැනීම ආරම්භ වූයේද සාලි යුගයේදීය. මෙම සම්පත් සාමුහිකත්වයෙන් තොරව ස්වාධීන භුක්තියට හසුවීම මත සියලු මානව සම්බන්ධතා කඩවන ආකාරය සූත්‍රයේ දක්වා ඇත්තේ පුද්ගල මනසේ සිදුවූ පරිවර්තන රාශියක් ඔස්සේය. විශේෂයෙන්ම සන්නිධිකාරය (සම්පත් රැස්කිරීම) අලසත්ත (අලසබව) ලොලත්තං (ලොල්බව) දිට්ඨානුගති (දුටුදේ අනුකරණය කිරීම) යන තත්වයන් හමුවේ මිනිසුන් සැහැසි වන ආකාරය ඉතා මැනවින් දක්වා ඇත.

නූතනයේ ලෝකයේ පවතින සෑම ගැටුමක්ම පසුපස කුමන හෝ ආර්ථිකමය ප්‍රතිලාභ අත්පත් කරගැනීමේ මානසිකත්වයක්

මුල්කොට ක්‍රියාත්මක වන බව නොරහසකි. එම ගැටුම් පිටුපස සැගවී ඇත්තේ ශක්මත් පාර්ශවය විසින් දුර්වල පාර්ශවය සතු සම්පත් ක්‍රමයෙන් අත්පත් කරගැනිමය. මෙම තත්වය මානව සමාජයේ ආරම්භයේ පටන් සිදුවී ඇත. පසුව පැවති සම්පත් සමස්තය අතර සමසේ බෙදා භුක්ති විඳීමේ අවශ්‍යතාවය උදාවිය. ඒ සඳහා මහජනයා යෝජනා කරනුයේ සමස්ත ජනයාගේ අනුමැතියෙන් යහපත් චර්යාවක් ඇති පුද්ගලයා තම පරිපාලකයා ලෙස තෝරාගැනීමය. නමුත් නූතනයේ ලෝකයේ පවතින ගැටුම් විසඳීම සඳහා යෝජිත පුද්ගලයාගේ හෝ පුද්ගලයන්ගේ යහපත් චර්යාව ගැටුම් නිරාකරණය කිරීමේ තිර්ණායක සෙල එතරම් සැලකිල්ලට ලක් නොකරන අතර, ඔහු සතුව පවතින අවි බලය හෝ ධන බලය පමණක් සලකා ක්‍රියා කරනු ලබයි. මෙවන් තත්වයක් හමුවේ සමාජයේ පවතින ගැටුම් දිනෙන් දින සංකීර්ණත්වයට පත්වනවා පමණක් නොව මානවයාද කෲරත්වයට පවා ඇද දැමීමට සමත්ව ඇත. අග්ගඤ්ඤ සූත්‍රයට විවරණය සපයන වරාගොඩ පේමරතන හිමියන් දක්වා ඇත්තේ ආදි මිනිසා කෘෂි යුගයට ප්‍රවේශවීමත් සමගම (අ) ස්ථිර උපනිවේශ පිහිටුවා ගැනීම (ආ) සාමුහික සම්මුති මගින් ගැටලු නිරාකරණය කරගැනීම (ඇ) සමාජ කාර්යයන් සංස්ථාගත කිරීම (ඈ) වර්තමාන තත්වයන්ට අනුරූප වන සේ චර්යාධර්ම සංස්කරණය කිරීම... යන මෙම අවස්ථා තුලින් පෙන්වා දී ඇත්තේ සමාජ සංස්ථා ආර්මභයේදී ද ගැටුම් විසඳීම සඳහා යොදාගත් මිනුම් දඬු හතරක් ලෙසය. මෙම මිනුම් දඬු පැහැදිලිවම නූතනයේ පවතින ගැටුම් විසඳීම සඳහා ඉතා මැනවින් යොදාගත හැකිය.

## ගැටුම් විසඳීමේ නූතන ක්‍රමවේද හා බුදු සමය

වර්තමානයේ ගැටුම් අධ්‍යයන ක්ෂේත්‍රය තුල මූලික වශයෙන් භාවිත කරනු ලබන ගැටුම් පහලවීම හා ඒවා නිරාකරණය සඳහා භාවිත ක්‍රමවේද කිහිපයක් දක්වා ඇත.

1. මානව අවශ්‍යතා මූලධර්මය Human Needs Theory- මෙම මූලධර්මයට අනුව මූලික වශයෙන් සමාජයේ ගැටුම් නිර්මාණය වනුයේ මානවයාගේ මූලික අවශ්‍යතා ඉටුනොවීම නිසා බව දක්වයි. සාමාන්‍ය වශයෙන් මිනිසාට ස්වකීය පැවැත්ම තහවුරු කරගැනීම සඳහා ආහාර, සෞඛ්‍ය, නිවාස, සුරක්ෂිතාව වැනි තත්වයන් වශයෙන්



අවශ්‍ය වේ. එම අවශ්‍යතා ඉටු නොවූ පසු මිනිසුන් ප්‍රචණ්ඩත්වයට පත්වේ. මීට කදිම නිදසුනක් දීඝනිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ හඳුනාගත හැකිය. දිළින්දන්ට ධනය නොදීම මූල් කරගනිමින් සමාජ ගැටලු නිර්මාණය වූ ආකාරය දක්වා ඇත. අධනානං ධනෙ අනනුප්පාදීයමානෙ දාළිද්දියං වෙපුල්ලමගමාසි. දාළිද්දියෙ වෙපුල්ලං ගතෙ අඤ්ඤතරො පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසංඛාතං ආදියි. ධනය නොමැති පිරිස් හට ධනය නොදීම නිසා දිළිදුබව විපුලත්වයට පත්විය. දිළිඳුබව දරුණුවූ විට එක් මිනිසෙක් අන්සන්තක වස්තු සොරකම් කරන ලදි. ඒ අනුව සමාජයේ පවතින කුමන හෝ ගැටලුවක් විසඳීමට නම් ගැටලුව නිර්මාණය වන මූලික මූලයට ප්‍රතිකර්ම කළයුතුය. ඒ අනුව පටිච්චසමුප්පාද මූලධර්මයේ එන ආකාරයට යමක් නිර්මාණය වීමේ හේතුව මුලිනුපුටා දමන්නේ නම් එහි ඵල පිළිබඳව යලි ප්‍රශ්න කිරීමක් අවශ්‍ය නොවේ. එනම් දිළිඳුකම පිටුදැකීම සඳහා ක්‍රියාමාර්ග යොදන්නේ නම් මිනිසුන්ගේ මූලික ප්‍රශ්න විසඳෙනු ඇත. නූතනයේ පවතින බෝහෝ ගැටලුවල පදනම දිළිඳුකම බව අපට සිතිය හැක්කේ ඒ ඒ රටවල ඇති ඒක පුද්ගල ආදායම පරීක්ෂා කරබැලුව හොත් ඒක පුද්ගල ආදායම වැඩිම රටවල් යුධමය තත්වයන්ගෙන් බැහැරවී ඇත. දිළිඳුකම වැඩිම රටවල් සියල්ලක් පාහේ යුද්ධ සඳහා මැදිව කටයුතු කරනු ලබයි. ඒ අනුව මිනිසුන්ගේ මූලික අවශ්‍යතා තේරුම් ගනිමින් යම් රජයක් හෝ යම් පාලක පිරිසක් කටයුතු කරන්නේ නම් ගැටුම් අවම කරගත හැකිය.

2. න්‍යායාත්මකව මතභේද සමනය කිරීමේ මූලධර්මය Principled Negotiation Theory- මෙම මූලධර්මයට අනුව දක්වා ඇත්තේ ගැටලු විසඳාගැනීමේ ක්‍රමවේද මොනවාද යන්නය. මජ්ඣිමනිකායේ දැක්වෙන මධුපිණ්ඩික සූත්‍රයට අනුව ගැටුමට මූලික හේතුව ලෙස දක්වා ඇත්තේ මිනිසා විසින් බාහිර ලෝකය හමුවේ ගොඩනගා ගන්නාවූ මානසික ක්‍රියා කාරිත්වයයි. එහි දැක්වෙන ආකාරයට ගැටුම් පහලවීම ඉතා සරලත්වයේ සිට සංකීර්ණත්වය දක්වා විභාග කොට තිබේ. ඇසත් රූපයත් නිසා ඇසමුල්කර ගත් චක්ෂු විඤ්ඤාණය පහල වේ. මෙම ත්‍රිත්වයේ ක්‍රියාකාරිත්වය මත ස්පර්ෂය ඇතිවේ. ස්පර්ෂය මත මානසික වේදනාවක් හෙවත් මානසික රුචිකත්වයක් ඇත්වේ. මානසික රුචිකත්වය මත, යමක් විඳින්නේද එය හඳුනාගනු ලබයි. යමක් හඳුනාගන්නේද එය පිළිබඳව විතර්ක



OCT 2015

කිරීමක් මානසිකව සිදු කරනු ලබයි. එම විතර්කයෙන් පසුව ප්‍රපඤ්ච කරණයක් සිදුවේ. එම ප්‍රපඤ්ච කරණයේ ප්‍රතිඵල ලෙස එය අතීත අනාගත වර්තමාන ලෙස මිනිස් සිතේ පවති. මෙම අසහනකාරි මානසික තත්වය සියලු ගැටුම් උදාවීමේ පදනම ලෙස බුදු සමය දක්වා ඇත. බෞද්ධ මූලධර්ම අතර ගැටුම් නිරාකරණය සඳහා යෝජිත අධිකරණසමථ 7ක් දක්වා ඇත. 1. සම්මුඛවිනය- ගැටලුවක් විසඳීමට නම් චූදිත-චෝදක යන උභය පිරිස් සමභාගි විය යුතුය. 2. සති විනය- යම් චෝදනාවක් ඉදිරිපත් කරන්නේ නම්, චෝදනාවක් කිරීමට තරම් චූදික පක්ෂය සතුව (විශේෂයෙන්ම මානසික) පසුබිමක් තිබිය යුතුය. 3. අමූළ්හවිනය- චෝදනාවක් ඉදිරිපත් කරන අවස්ථාව තුල පුද්ගලයා පවතින මානසිකත්වයේ තත්වය පිළිබඳව සැලකිය යුතුය. 4. පටිඤ්ඤාතකරණය- අවුල් වියවුල් සංසිඳවීම සඳහා නිවැරදි යාන්ත්‍රණයක් පැවතිය යුතු මෙන්ම, වැරදි කරුවන් දඬුවමටත් නිවැරදි කරුවන් නිදහස් වීමටත් අවස්ථාව ඇති කළ යුතුය. 5. යෙභුය්‍යසිකා- මෙහිදී ධර්මවාදීන් වැඩිදෙනාගේ අදහස් අනුව කටයුතු කිරීම යනුවෙන් දක්වතත්, මෙම න්‍යායාත්මක මූලධර්මය පිළිබඳව ගැඹුරින් සලකා බැලූවිට ධර්මවාදීන් බහුතරයක් ගනුලබන තීර්ණයක් නිසා සුළුතරයක් අගතියට පත්වේ ය යන අදහසක් ඇතිවිය හැකිය. එහෙත් අප විසින් කල්පනා කළ යුතු කරුණ වනුයේ ධර්මවාදීන් ගනු ලබන කිසියම් තීර්ණයක් වෙත්ද, එම තීර්ණ ලෝභ, ද්වේෂ, මෝහ යන අකුසල ධර්ම මත නොපවතින බවයි. ඒ අනුව සියල්ලටම සාධාර්ණයක් සිදුවන, අගතියෙන් තොර කුසලය හා අකුසලය මැනවින් අවබෝධ කොටගත් පිරිස් විසින් ලෝකයේ පවතින ගැටුම් විසඳීමෙ පුරෝගාමියෝ විය යුතුය යන මතය බුදු සමයෙන් යෝජනා කරන ආකාරයක් දක්නට ලැබේ. 6. තස්සපාපියසිකා- යම් පුද්ගලයෙක් වරදක් කළ විට එය සැගවීම තුලින් සමජය අසහනය මෙන්ම, පුද්ගල මානසික අසහනය ද ගොඩනැගේ. ඒ අනුව විවෘර්තභාවය ගැටුම් නිරාකරණය සඳහා අත්‍යාවශ්‍යඅංගයක් සේ දැක්විය හැකිය. 7. තිණවත්ථාරක- ගැටුම් ප්‍රශ්න සොයා බලා ඒවා කිසිදු ආකාරයකින් හෝ විදීමට යෑම තත්වය තිබූ තත්වයෙන් වඩාත් නරක අටත හැරෙන්නේ නම් (දුර්ගන්ධයක් තණකොළවලින් වසන්නාක් මෙන්) සිදුවූ යම් සිදුවිමක් ඇත්නම් ඒවා පසෙකලා පවතින තත්වයෙන් මිදීමට කළයුතු ක්‍රියා කාරකම් සිදු කිරීම මෙයින් දක්වා ඇත. නූතන ලෝකයේ ගැටුම් හා ඒවා විසදාගැනීමේ ක්‍රමවේද බවට පත්ව ඇත්තේ එක්කෝ යුද්ධ කිරීම හෝ නැතහොත්



සම්බාධක පැනවීම වැනි ක්‍රියා මාර්ගයන් ය. එසේත් නැතහොත් අන්තර්ජාතික වැඩකටයුතු වලින් ඉවත් කිරීම වැනි තීර්ණයන්ය. නමුත් බුදු සමය යෝජනා කරනුයේ සාකච්චාවෙන් හා පොදු එකඟතාවයෙන් යමක් පිළිබඳව කටයුතු කිරීමය. මේ අනුව මිනිස් ලෝකයේ සිදුවන විවිධ ගැටුම් විසඳා ගැනීම සඳහා මෙම අධිකරණමසථ හත ආලෝකයක් සපයනු ලබයි.

3. ජන සම්බන්ධතා (ගොඩනගගැනීමේ) මූලධර්මය Community Relation Theory- මෙම මූලධර්මයට අනුව දක්වා ඇත්තේ ගැටුම් නිර්මාණය වීම සඳහා ඒ ඒ ජන කොටස් අතර පැවතිය යුතු අන්‍යෝන්‍ය විශ්වාසය, එක් ජනකොටසක් හෝ පාර්ශවයක් විසින් තවත් පාර්ශවයක් අදහනු ලබන ආගමික හෝ සංස්කෘතිකමය අනන්‍යතා ඉවසීමය. එම අනන්‍යතාවන් මධ්‍යස්ථ සිතින් හා උපෙක්ෂාවෙන් යුතුව අත්විඳිමින් පුද්ගලයා ක්‍රියා කළයුතුය. ලෝකයේ ආරම්භක යුගයේ සියලු සත්වයන් එකම ස්වරූපයෙන් පැවතියද පසුව ප්‍රජාව බෙදීයෑම ආරම්භ විය. මෙම බෙදීයෑම ශාරීරික වර්ණය මත සිදුවිය. පසුව එය කුලවාදයක් බවටත්, සමාජ පංතිවාදයක් බවටත් පත්විය. එහි අවසාන ප්‍රතිපලය වූයේ එකම මිනිස් ප්‍රජාව අතර විවිධතා නිර්මාණය වීමය. කිරිමැටියාවේ ධම්මසිරි හිමියන් සපයන ලද මානව අයිතිවාසිකම් පිළිබඳ බෞද්ධ දෘෂ්ටිකෝණයකින් විමසුමක් යන විමර්ශනයේදී පෙන්වා දෙන්නේ වාසෙට්ඨ, මධුර වැනි සූත්‍ර ධර්මයන් තුළින් බුදුන් වහන්සේ විවිධ න්‍යායන් උපයෝගී කොටගෙන කුලවාදය දැඩි ලෙසම විවේචනයට භාජනය කොට ඇත, ජීව විද්‍යාත්මක තාර්කික ක්‍රම (Biological Arguments), සමාජ විද්‍යාත්මක තාර්කික ක්‍රම (Sociological Arguments), සදාචාරාත්මක ආගමික තාර්කික ක්‍රම (Ethical & Religious Arguments), ආදී තාර්කික පදනම් තුළින් බුදුන් වහන්සේ අවසානයේ දේශනා කරනුයේ සිවුමහා ගංගාවන් මුහුදට වැටුණු පසු එකම ජලයක් බවට පත් වන්නා සේ විවිධ දිශාවෙන් පැමිණ බුදු සසුනේ සැබෑ ප්‍රව්‍රජ්‍යාව ලබන ඔවුන් ශ්‍රමණ සක්‍යපුත්‍රයන් බවට පරිවර්තනය වන ආකාරයයි. මෙයින් සැමදෙනාම ඒකත්වයෙන් සලකා ඇත. එපමණක්ද නොව බැමිණිය, ක්‍ෂත්‍රිය කාන්තාව, ක්‍ෂුද්‍ර තැනැත්තිය යන මොවුන් සියලු දෙනා ගැබ්බර වේ නම් ඔසප් වේ නම් මෛථුනයෙහි ප්‍රතිඵලයක් ලෙස දරුවන් සුජාත කරන්නේ නම් හා බමුණෙක් ක්‍ෂුද්‍ර තැනැත්තිය සමග සංසර්ගයේ යෙදී දරුවෙක් බිහි වේ

නම් පූසෙක් හා බැල්ලියක් සංසර්ගය කළවිට දරුවන් බිහි නොවේ නම් එකම මිනිස් ප්‍රජාව මෙලෙස වර්ගීකරණයට ලක් කිරීම පදනම් විරහිත වූවක් ලෙස දක්වා සමාජ විද්‍යාත්මක තර්කනයන් මගින් ස්වාමියා යම් විටක දාසයෙක් වීමේ හව්‍යතාවත්, දාසයා ස්වාමියා වීමේ හව්‍යතාවත් සැබවින්ම සමාජයේ පවතින අයුරු පැහැදිලි කොට ඇත. එමෙන්ම කුමන බෙදීම් සමාජයේ පැවතියේ නමුදු කර්මයේදී කර්මපල බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ක්‍ෂුද්‍ර වශයෙන් වර්ග හෝ වර්ණ භේදය නොසලකා විපාක දෙන බව පෙන්වා දෙයි. මෙයින් පැහැදිලිවම පෙනීයන්නේ ජනතා සම්බන්ධතා ගොඩනැගීමේ මූලධර්මය සමාජගැටුම් බැහැරකිරීමේ නිර්ණායකයක් ලෙස ඉතා පැහැදිලිව බුදු සමය අවධානයට යොමු කර ඇති බවයි.

4. හඳුනාගැනීමේ මූලධර්මය Identity Theory- මෙම මූලධර්මයට අනුව විග්‍රහ කරනුයේ යම් ගැටුමක් නිර්මාණය වී ඇත්නම් එම ගැටුම නිර්මාණය වීමට පදනම සොයනවා මෙන්ම ගැටුමට පාදක වූ පිරිස් කණ්ඩායම් අතර යම් යම් සුහදතා ගොඩනගා ගැනීමට වැඩමුලු, සාකච්ඡා, සංවාද පැවැත්විය යුතු බවයි. තවත් අතෙකට ඒ ඒ පිරිස් අතර අනන්‍යතා ගොඩනැගීම සඳහා ද්විපාර්ශීය එකගතාවන් ඇති කරගත යුතුය. මෙම මූලධර්මයෙන් මූලිකව විමර්ශනය කරනුයේ කුලය, ජනවර්ගය, භාෂාව, නියෝජනය කරනු ලබන ජාතිය හෝ ජන වර්ගය යන බෙදීම් වලින් තොරව සියල්ලෝම ඒක කත්වයෙන් පිළිගැනීමයි. කෙනෙක් පහල වූ කුලය හෝ ධනය මත වරප්‍රසාද ලැබීමේදී ද්විරූපතාවක් පවතින්නේ නම් අනිවාර්යෙන්ම ස්වකීය අනන්‍යතාවය මුල් කරගනිමින් ගැටලු පහලවීම ස්වාභාවිකය. නිදසුනක් ලෙස රෝහිණී ගංගාවේ ජලය බෙදාගැනීම වෙනුවෙන් යුද්ධයකට සූදානම් වූ සාක්‍ය හා කෝලිය පිරිස අතර පැවති ගැටලුව විසඳීම සඳහා බුදුන් වහන්සේ මැදිහත් වන ලදි. මෙහිදී තම තම අයිතිවාසිකම් හා අනන්‍යතා දෘෂ්ටිවාද බවට පත්කර ගනිමින් යුධමය වාතාවර්ණයක් දක්වා ඒවා ව්‍යාප්තවූ ආකාරයයි. විඩූභ කුමරු සාක්‍යයන් සමූල ඝාතනය කිරීමට පෙලඹුණ අවස්ථා ආදිය දැක්විය හැකිය. කුලය පදනම් කරගනිමින් උමතුවටත් උඩඟුවටත් පත් සාක්‍යයෝ අවසානයේ මරණයෙන් වන්දි ගෙවනු ලබයි. තවත් ආකාරයකට විමසා බැලුව හොත් හින්දුන්ගේ ධර්ම යුද්ධය මෙන් සමාජ සාධාරණත්වය වෙනුවෙන් ජීවිත හානිය බුදු සමය අනුමත කරන්නේ නැත. යමෙක්



බුදුන් වහන්සේගේ සමීපයේ ප්‍රව්‍රජ්ජාව අපේක්ෂාවෙන් පැමිණි සසුනට ප්‍රවේශ වීමත් සමග ඔවුන් තුල එතෙක් පැවති (වර්ණභාවය හෙවත් කුලවත් බව) විවර්ණ බවට පත්වේ. කුලය පිළිබඳ සලකා කිසිදු ආධ්‍යාත්මික අර්ථයක් දියුණු නොවන බව බුදුන් වහන්සේ පෙන්වා දී ඇත. මේ සාසනයට යමෙක් ප්‍රවේශ වන්නේද ඔවුහු සියල්ලෝ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන් බවට පත්වේ. ඔහුන් සියල්ලෝම ශ්‍රමණඵල ස්ත්‍රී පුරුෂ භේදයෙන් තොරව භුක්ති විඳිනු ලබයි. එහිදී සාමාන්‍ය සමාජයේ පවතින උපත පදනම් කරගත් අනන්‍යතා ලක්ෂණ සැලකිල්ලට ලක් නොකරණ අතර පුද්ගලයාගේ මානසික දියුණුව පමණක් සලකා ක්‍රියාත්මක වේ.

5. සන්නිවේදන මූලධර්මය Communication Theory- මෙම මූලධර්මයට අනුව දක්වා ඇත්තේ විවිධ ජන පිරිස් විසින් නියෝජනය කරනු ලබන ආගමික හෝ දේශපාලනික මතවාද තුළින් යම් ගැටලුවක් පහල වීමේ අවකාශය වේ නම් ඒවා වලක්වා ගැනීම සඳහා ගැටුමට පාදක ජන කණ්ඩායම හෝ එම පිරිස් සමග විශ්වාසනීය සන්නිවේදනයක් පැවැත් විය යුතු බවයි. එහිදී ගැටුමට එලඹෙන පාර්ශ්ව අතර අන්‍යෝන්‍ය අවබෝධය ඇති කළ යුතුය. නිෂේදාත්මක පිළිගැනීම් බැහැර කළ යුතුය. අන්තර් සංස්කෘතික සන්නිවේදනය ශක්තිමක් කළ යුතුය. බුදු සමයට අනුව ආලවක සූත්‍රයේදී බුදුන් වහන්සේ මෙම ක්‍රමවේදය යම් ආකාරයට යොදාගෙන ඇත. විටක ආලවක තෙම බුදුන් වහන්සේට නික්මීමට අණ කළවිට එය බුදුන් වහන්සේ පිළිගනු ලබයි. එහෙත් ආලවකගේ සැබෑ ස්වරූපය අවබෝධ කරගත් බුදුන් වහන්සේ පසුව ඔහුව පරාජය කරනුයේ අවිබලයෙන් නොව ධර්මය නැමති අවියෙන්ය. අනෙක් අතට මජ්ඣිමනිකායේ උපාලි සූත්‍රයට අනුව ඔහු බුද්ධ ශ්‍රාවකයෙක් වූ පසු බුදුන් වහන්සේ දේශනා කරනුයේ මෙතෙක් ක්‍රියාත්මක කළ අන්‍ය ශ්‍රමණ පිරිස්හට සැලකීම නතර නොකරන ලෙසටය. ඒ අනුව ඒ ඒ පුද්ගල කණ්ඩායම් අතර ආගමික කරුණු පදනම් කොට යම් ගැටුමක් නිර්මාණය වීමට තිබූ අවස්ථාව වලක්වා ගැනීමක් හා සමානය. මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රයට අනුව සමාජයේ උන්නතිය වෙනුවෙන් යහපත් සන්නිවේදනය කෙතරම් ප්‍රයෝජනවත්ද යන්න හඳුනාගත හැකිය. එහි දැක්වෙන ආකාරයට ආශාව මුල්කර ගනිමින් රජවරු රජවරු සමඟ ද වාද විවාද කෙරෙති, කැත් කුලයෝ කැත් කුලයන් සමඟ ද, බමුණෝ බමුණන්

සමඟ ද, සොහොයුරෝ සොහොයුරන් සමඟ ද, සැමියා අඹුව සමග ද වාද විවාද කරති, ගුටිබැට හුවමාරු කරගනිති, දඬුමුගුරු වලින් ගහ ගනිති. තියුණු ආයුධ වලින් කපා කොටා ගනිති. මේ හේතුනිසාම මරණයට පත්වේ. තවත් අවස්ථාවක අංගුලිමාල වැනි දරුණු පුද්ගලයන් හික්මවීම සඳහා අන්තර් සන්නිවේදනය කෙතරම් අපූර්වත්වයට බුදුන් වහන්සේ යොදා ඇති ද යන ආකාරය අවබෝධ කරගත හැකිය. ඒ අනුව ලෝකයේ පහලවී ඇති සෑම යුද්ධ ගැටලුවක්ම විසඳා ගැනීම සඳහා කුහකත්වයෙන් තොර විවෘත වාග් මාලාවක් මෙන්ම බුද්ධිමත්ව ක්‍රියාකිරීමේ හැකියාව පැවතිය යුතුය.

6. ගැටුම් වැලැක්වීමේ මූලධර්මය Conflict Transformation Theory- ගැටුම් නිර්මාණය වීම සඳහා මූලික වශයෙන් බලපාතු ලබන්නේ සමාන සමාජ අවස්ථා නීතිය ආර්ථිකය සංස්කෘතිය වැනි අවස්ථා තුල නොලැබී යෑම විය හැකිය. ඒ අනුව සමාජ, ආර්ථික හා නීතිමය අවකාශයන් තුළ කිසියම් ජන කණ්ඩායමක් අසාධාරණයට ලක් වන්නේ නම් එම අසමානතා පිටුදැකිම සඳහා ක්‍රියා කිරීම අනිවාර්ය වේ. මේ සඳහා දිගුකාලීන වශයෙන් බලපවත්වන පරිදි පුද්ගලයන් තුළ සුහදතා ගොඩනැංවීමට මෙන්ම ඔවුනොවුන්ගේ ආකල්ප හා දැක්ම වෙනස් කිරීම සඳහා ක්‍රියා කළ යුතුය. නූගත්කම පිටුදැකීමට සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. නීතිය හා සමානාත්මතාවය රාජ්‍ය විසින් ගොඩනැංවිය යුතුය. මජ්ඣිම නිකායේ දැක්වෙන කෝසම්බිය සූත්‍රයට අනුව ගැටුම් වලක්වා ගැනීමේ ක්‍රම හයක් දක්වා ඇත. අපගේ විමර්ශනය සඳහා ඉන් කිහිපයක් පිළිබඳව අවධාවය යොමුකළ හොත්, 1. මෛත්‍රී සහගත කාය කර්මයෙන්ද, 2. මෛත්‍රී සහගත වචී කර්මයෙන්ද, 3. මෛත්‍රී සහගත මනෝකර්මයෙන්ද, එකිනෙකාට ගරුකරමින් විවාද නොකර එකීයත්වයෙන් ක්‍රියා කළ යුතුය යන ඉගැන්වීම බුදු සමයෙන් යෝජනා කර ඇත. 4. යම්හෙයකින් භික්ෂුවකට ලැබෙන ලාභයක් (ලැබීමක්) වේද එය අසවලාට දෙමි අසවලාට නොදෙමි යනුවෙන් භේදයෙන් තොරව සමසේ බෙදා හදා භුක්ති විඳිම පුද්ගලයන්ගේ ඒකීය භාවය සඳහා උපයෝගී වන්නේය. ලෝකයේ සෑම ගැටලුවක්ම තෘෂ්ණාව මුල්කර ගනිමින් ක්‍රියාත්මක වේ. ඒ අනුව බුදු සමය යෝජනා කරනුයේ මෛත්‍රී සහගත මනෝභාවයෙන් කටයුතු කරන්නේ නම් මිනිසා කිසිදු ගැටුමකට පාත්‍ර නොවන බවයි. අනෙක් අතට නූතන ගැටුම් උදාවීම



සඳහා බලපා ඇති ඉතා ප්‍රබල කාරණයක් නම් සම්පත්වල ඇති අයිතිය හා ඒවා බෙදාගානීම විෂයෙහි පවතින අසමානතාවන්ය. බුදු සමය යෝජනා කරන්නේ තමන්ට ලැබෙන පිණ්ඩපාතය වර්ණ භේදයෙන් හෝ ගෝත්‍ර භේදයෙන් තොරව සමාන සාධාර්ණත්වයෙන් භුක්ති විඳිමේ ඇති හැකියාව වර්ධනය කරගත යුතු බවයි. එයින් මිනිසුන් අතර ගොඩනැගෙන සුහදතාව වඩාත් අවධාර්ණය කර ඇත.

ගැටුම් නිර්මාණය වීමට බලපාතු ලබන මූලික මනෝභාවයන් හතරක් තවත් අවස්ථාවක බුදු සමය දක්වා ඇත. එනම් 1. ඡන්දයෙන් අගතියට යෑම 2. ද්වේශයෙන් අගතියට යෑම, 3. භයෙන් අගතියට යෑම, 4. මෝහයෙන් අගතියට යෑම, මෙකී කුමන අවස්ථාවක් තුල හෝ පුද්ගලයා මධ්‍යස්ථ නොවී ක්‍රියා කරන්නේ නම් එවන් පරිසරයක් තුල සාමයක් පිළිබඳ අපේක්ෂා තබාගත නොහැක. අප සියලුදෙනා වේගයෙන් දියුණුවන ලෝකයක ජීවත් වෙමු. කුමන හෝ සංස්ථාවක් අතර ගැටුම් අර්බුධ උදාවීම ස්වභාවික වූවද, ගැටුම් නිර්මාණය වීම සඳහා ප්‍රධාන කරුණු හතරක් බලපා ඇතිබව බුදු සමය අවධාර්ණය කර ඇත. 1. වෙපුල්ලමහත්තතා (පිරිස වැඩිවීම) 2. ලාභග්ග මහත්තා (ලැබීම් වැඩිවීම) 3. රත්තඤ්ඤු මහත්තතා (යමක් ආරම්භකර කල්ගතවීම) 4. බාහුසච්ච මහත්තතා ( දැන උගත්කම වැඩිවීම), කෙලෙස් වර්ධනයවීමට මූලික වන මෙම කරුණු ආසවට්ඨානීය ධර්ම ලෙස දක්වා ඇත. නූතනයේ පවතින ගැටුම් නිර්මාණය වීමට මෙම ආසවට්ඨානීය ධර්මවල දැක්වෙන කරුණු කෙතරම් ප්‍රායෝගික දැයි අපට හඳුනාගත හැකිය.

මෙම කරුණු සියල්ල සලකා බැලුවිට පෙනී යන්නේ ලෝකයේ ගැටුම් නිරාකරණය කරගැනීමේ මාවත පවතින්නේ අප මනසේම බවයි. සෑම ගැටලුවක්ම මනසේ ක්‍රියාත්මක වන රෝගකාරක තත්වයක රෝගි ලක්ෂණ බඳුය. විශේෂයෙන්ම බුදු සමය පෙන්වාදෙන ආකාරයට මනසේ නිරන්තරයෙන් ක්‍රියාත්මක වන රෝගකාරක ධර්ම පහක් දක්වා ඇත. ඒවා නීවරණ ධර්ම ලෙසද පෙල ගස්වා ඇත. යම් පුද්ගල මනසක කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච, විචිකිච්ඡා යන අකුසල අංශ පහ පවතීද, එතෙක් ලෝකයේ හෝ පුද්ගල මනසේ සාමයක් නොමැත. අරගල හා ගැටුම් සෑමවිටම මිනිසා පෙලා දමන සුළුය. ධම්මපදයේ දැක්වෙන එක් සඳහනකට අනුව ලෝකයේ සියලු

සත්වයෝ දණ්ඩනයට භය වේ. අසවලා මා පරාජයට පත්කළේය, මට අපහාස කළේය, යමෙක් මෙලෙස සිතා පෙරලා වෛර කිරීමට පෙළඹෙන්නේ නම් එවන් පුද්ගලයෙකුගේ වෛරය තමාටම අවසානයේ විනාශයක් රැගෙන එනබව බුදු සමය පෙන්වා දෙයි. ඒ අනුව බුදු සමය යෝජනා කරනුයේ ලෝභයෙන් ජීවත් වන්නෝ අතර අලෝභයෙන් ජීවත් වන පුද්ගලයෙක් වන ලෙසත්, ද්වේෂයෙන් ජීවත් වන්නන්නෝ අතර අද්වේෂයෙන් ජීවත් වන්නෙක් වන ලෙසත්, මෝහයෙන් ජීවත්වන්නෝ අතර අමෝහයෙන් ජීවත් වන්නෙක් වන ලෙසත් ය. මේ අනුව පෙනීයන්නේ ගැටුම් නිරාකරණය සඳහා සුදුසුම මාර්ගය වනුයේ සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රි ශික්ෂා මාර්ගය වර්ධනය කිරීමත්, දාන, ශීල, භාවනා යන පක්ෂයන් වර්ධනය කිරිමත් ය.

## නිගමනය

සමස්ත සමාජය සමඟ සාමයෙන් හා සහජීවනයෙන් ජීවත් වීමට, බුදු සමය නිරන්තරයෙන් යෝජනා කරනුයේ මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සිව්බඹ විහරණ යන්ට අනුව පුද්ගල චර්යාව ගොඩනගා ගතයුතු බවයි. උක්ත දැක්වූ ගුණ ධර්ම පුද්ගල අභ්‍යන්තරය තුල පවතින්නේ නම් ආර්ථික, සාමාජික හා දේශපාලනික සන්දර්භයන් තුල විෂමතාවක් ගොඩ නොනැගෙනවා ඇත. බුදු සමයට අනුව සාමය ලඟාකරගැනීම සඳහා ක්‍රමවේද රාශියක් සාකච්ඡා කරඇත. එහෙත් මිනිසුන්ගේ මූලික අවශ්‍යතා සම්පූර්ණ නොකරන්නේ නම් ගැටුම් පහල වීම ස්වභාවික බව ප්‍රතික්ෂේප කර නොමැත. නමුත් ප්‍රශ්න, ගැටලු නිර්මාණය වන හේතු මුලිනුපුටා දැමුවිට, සමාජය සතුටින් සහ සහජීවනයෙන් ක්‍රියාත්මක වන බව ඉතා මැනවින් චක්කවත්තිසීහනාද සූත්‍රයෙන් විවරණය කර ඇත. ඒ අනුව සාමයට හා ගැටුම් නිරාකරණයට ඇති වටිනාම මාර්ගය වනුයේ ලෝභ, ද්වේෂ, මෝහ යන අකුසල පක්ෂයෙන් මිදි ඊට ප්‍රතිපක්ෂවූ කුසල පක්ෂය වර්ධනය කිරීමය.



## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. දීඝ නිකාය, අග්ගඤ්ඤ සූත්‍රය, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, නැදිමාල දෙහිවල, 2006
2. දීඝ නිකාය, චක්කවත්ති සීහනාද සූත්‍රය, එම
3. මජ්ඣිම නිකාය, මධුපිණ්ඩික සූත්‍රය, එම
4. මජ්ඣිම නිකාය, වාසෙට්ඨ සූත්‍රය, එම
5. මජ්ඣිම නිකාය, මධුර සූත්‍රය, එම
6. සංයුත්ත නිකාය, නිදාන සංයුත්තය, එම
7. රණසිංහ ලලිත්, ආදි බුදුසහමෙහි පැනෙන නීති දර්ශනය,බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 1998
8. හෙට්ටිආරච්චි, ධර්මසේන, බෞද්ධ සමාජ විද්‍යා ප්‍රවේශය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2001
9. Studies in Buddhist Philosophy and Religion, Collected Papers of Prof. P.D. Premasiri, Peace within and Peace without: A Buddhist View, by P.D. Premasiri, Edited by, Soorakkulame Pemaratana and Raluwe Padmasiri, Published by Buddha Dhamma Mandala Society, Singapore, 2006
10. Buddhist Studies, Essays in Honour of Prof. Lily de Silva, An Introduction to Aggannasutta, W. Pemaratana, Published by Department of Pali and Buddhist Studies, University of Peradeniya, 2002
11. International Journal of Peace Studies, Volume II, Number I, Articale by Theresa Ser-lan Yeh, spring/ Summer 2006